මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/REG/CIR/2024/01 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2024.08. 15 |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 03/2024

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා
රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් බලාත්මක කිරීම දශක කිහිපයක සිට රට තුළ පැවති දීර්ඝකාලීන අවශ්‍යතාවයක් වූ අතර එකී අවශ්‍යතාවය සපුරාලනු වස් රජය විසින් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මේ වන විට නීතිගත කර ඇත.

02. මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කරන්නා වූ, මූල්‍ය විනය, විනිවිදභාවය, වගවීම, කාර්යක්ෂමතාවය සහ ආර්ථික සඵලදායීතාවය සහතික කෙරෙන ඵලදායී විධිවිධාන රැසක් ද ඇතුළුව නෛතිකව ශක්තිමත් වූ සහ නිශ්චිත ලෙස බලාත්මක කළ හැකි මූල්‍ය රීති රාමුවක් හඳුන්වාදීම සහ විධිමත් ලෙස ක්‍රියාත්මක කළ හැකි රාජ්‍ය ආයෝජන කළමනාකරණ යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම වැනි රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ වන බොහෝ ක්ෂේත්‍ර ආවරණය කරන පුළුල් නීතිමය රාමුවකට අවශ්‍ය විධිවිධාන මෙකී පනත මගින් සළසා ඇති අතර මේ දක්වා ක්‍රියාත්මකව පැවති 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 08 වන හා 14 වන වගන්ති අවලංගු කර එකී ප්‍රතිපාදන ද මෙම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට ඇතුළත් කර ඇත.

03. මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, පහත සඳහන් සියළු රාජ්‍ය ආයතනයන් (රාජ්‍ය අස්තිත්වයන්) සහ ප්‍රධාන ගණන්දීමේ නිලධරයෙකු, ගණන්දීමේ නිලධරයෙකු හෝ නිසි බලධරයෙකු ඇතුළුව මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ බලතලයක් හෝ කාර්යයක් පිරිනමන ලද, පවරන ලද හෝ භාරදෙන ලද රාජ්‍ය අස්තිත්වයන්ගේ නිලධරයන් හා සේවා නියුක්තයන් සඳහා එහි විධිවිධානයන් අදාළ වේ.

(අ) රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක (අයවැය අස්තිත්ව)

(ආ) රජයේ මුදල් වෙන් කරනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් හා භාර

(ඇ) රජයට අයත් ව්‍යවසායයන් සහ

(ඈ) අදාළ ලිඛිත නීතීන්හි විධිවිධාන ප්‍රකාරව පළාත් සභා, පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු සහ පළාත් සභා, පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන වෙනත් ආයතන, සහ පළාත් පාලන ආයතන

04. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 67 හා 68 වගන්ති ප්‍රකාරව, මෙකී පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ වන නියෝග මුදල් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධියට පත් කොට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වේ. තව ද, මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යැයි සළකනු ලබන අනෙකුත් විධානයන් හා මාර්ගෝපදේශයන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

05. කෙසේ වුව ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 67 (6) උප වගන්තියේ විධිවිධාන පරිදි, ඉහතින් සඳහන් කරන ලද නියෝග, විධානයන් හා මාර්ගෝපදේශයන් නිකුත් කරනු ලබන තෙක් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන

(අ) 1992 වර්ෂයේ පළ කරන ලද මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන

(ආ) ජනාධිපති ලේකම්වරයා, භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ මහා භාණ්ඩාගාරය යටතේ වූ දෙපාර්තමේන්තුවල ප්‍රධානින් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ

(ඇ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ

මෙම පනතේ විධිවිධානයන්ට අනනුකූල නොවනතාක් කල් බලාත්මක වේ.

06. ඒ අනුව, උක්ත 03 ඡේදයෙහි සඳහන් සියළුම රාජ්‍ය ආයතන සහ නිලධාරීන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුගතව කටයුතු කළ යුතු බැවින් මේ පිළිබඳව ඔබ ආයතනයේ සියළු නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

07. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත http://www.documents.gov.lk/en/acts.php දරන යොමුව ඔස්සේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හෝ https://www.treasury.gov.lk/web/public-financial-management-act දරන යොමුව ඔස්සේ මහා භාණ්ඩාගාරයේ නිල වෙබ් අඩවිය මගින් බාගත කරගත හැකි අතර මේ සම්බන්ධයෙන් වන වැඩිදුර පැහැදිලි කිරීම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 0112-484618 දරන දුරකථන සම්බන්ධතාවය ඔස්සේ ලබාගත හැකි ය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති